වාරිමාර්ග අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් රත්කිඳ හා අරලගංවිල ගොවිපළ වල ඇති වාණිජ වී තොග අලෙවි කිරීම සඳහා මිළ ගණන් කැඳවීම.

යොමු අංකය: MASL/PROC/GOODS/NCB/SCPL/01

**ජනවාරි 2023**

Reference Only

**<u>ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් රත්කිඳ හා අරලගංවිල පිහිටි ගොවිපළවල ඇති වාණිජ වී තොග අලෙවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

<u>උපදෙස් හා කොන්දේසි</u>

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සී කලාපයට අයත් රත්කිඳ බීජ නිෂ්පාදන ගොවිපළෙහි හා බී කලාපයට අයත් අරලගංවිල බීජ නිෂ්පාදන ගොවිපලෙහි පහත සඳහන් පරිදි වාණිජ වී තොග අලෙවි කිරීම සිදු කරනු ලබයි.

| විස්තරය | | කාණ්ඩ අංකය (Lot No.) | වී වර්ගය | දළ වී ප්‍රමාණය (කි.ග්‍රෑ) |
|---|---|---|---|---|
| රත්කිඳ බීජ ගොවිපල - සී කලාපය | වාණිජ වී ලෙස සකස් කරන ලද | 01 | සම්බා | 37,527 |
| | | 02 | කීරි සම්බා | 49,231 |
| | | 03 | නාඩු | 62,860 |
| | කල් ඉකුත් වූ බීජ වී වාණිජ වී ලෙස | 04 | සම්බා | 13,509.5 |
| | | 05 | කීරි සම්බා | 187,185.5 |
| | | 06 | නාඩු | 4,571.5 |
| අරලගංවිල බීජ ගොවිපල - බී කලාපය | වාණිජ වී ලෙස සකස් කරන ලද | 07 | සම්බා | 5,197.7 |
| | | 08 | කීරි සම්බා | 25,810.7 |
| | | 09 | නාඩු | 107,034.4 |

2. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රය පමණක් මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා භාවිතා කළ යුතුය. එසේ නොමැති මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද විකිණීමට යෝජිත වී තොග පරීක්ෂාකර බලා මිල ගණන් ඉදිරිපත් කිරීමට උපදෙස් දෙනු ලැබේ.

3. මෙම වී තොග රත්කිඳ හා අරලගංවිල පිහිටි ගොවිපලවල් තුළදී **2023.01.16** දින සිට **2023.02.02** දින දක්වා සතියේ දිනවල **පෙ:ව 9.30 ත් ප:ව 3.00 ත්** අතර කාලය තුළ පරීක්ෂා කර බැලිය හැක.

4. අදාල ලංසු පත්‍රිකා, සමාගම් ලිපි ශීර්ෂයක් මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර රු. **5,000.00** ක ආපසු නොගෙවන තැන්පත් මුදලක් ගෙවා කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 9 වන මහලේ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැක. නොඑසේනම් ලංකා බැංකුවෙහි හයිඩ් පාක් ශාඛාවේ ඇති ගිණුම් අංක **2327542** දරණ ගිණුමට ආපසු නොගෙවනු ලබන තැන්පත් මුදල තැන්පත් කර අදාල මුදල් තැන්පතු පත්‍රිකාව සමග අදාල ඉල්ලීම් ලිපිය **masltenders@gmail.com** දරන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර ලංසු පත්‍රිකා ලබා ගත හැකිය. ලංසු පත්‍රිකා නිකුත් කරනුයේ **2023.01.13** දින සිට **2023.02.02** දින දක්වා සතියේ දිනවල **පෙ.ව. 09.30** සිට **ප.ව. 03.00** දක්වා පමණි.

5. නිසිලෙස සම්පූර්ණ කළ ලංසු පත්‍රිකා එක් එක් කාණ්ඩයට (Lots) අනුව පහත වගුවේ සඳහන් පරිදි ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතුවක් හෝ මාස 03 ක් වලංගු බැංකු අණකරයක් (Bank Draft) සමග ආයතනයේ නම, ලිපිනය හා ලංසුවෙහි නම ලියන ලද කවරයේ බහා මුද්‍රා තබා **2023.02.03** වන දින **ප. ව. 2.00** ට පෙර ලැබෙන සේ **කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 9 වන මහලේ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය, ප්‍රසම්පාදන අංශය** වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාව මගින් එවිය යුතුය. නැතහොත් අතින් ගෙනවිත් ටෙන්ඩර් පෙට්ටියට

Reference Only

බහාලිය හැකිය. මිල ගණන් විවෘත කිරීම **2023.02.03** වන දින ප.ව **2.00** ට එම ස්ථානයේදීම සිදුකරනු ලබන අතර එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පමණක් සහභාගි විය හැකිය.

| විස්තරය | | කාණ්ඩ අංකය (Lot No.) | වී වර්ගය | දළ වී ප්‍රමාණය (කි.ග්‍රෑ) | මුදල් / බැංකු අණකරයේ වටිනාකම - රු. |
|---|---|---|---|---|---|
| රත්කිඳ බීජ ගොවිපල-සී කලාපය | වාණිජ වී ලෙස සකස් කරන ලද | 01 | සම්බා | 37,527 | 40,000.00 |
| | | 02 | කීරි සම්බා | 49,231 | 50,000.00 |
| | | 03 | නාඩු | 62,860 | 65,000.00 |
| | කල් ඉකුත් වූ බීජ වී වාණිජ වී ලෙස | 04 | සම්බා | 13,509.5 | 15,000.00 |
| | | 05 | කීරි සම්බා | 187,185.5 | 200,000.00 |
| | | 06 | නාඩු | 4,571.5 | 5,000.00 |
| අරලගංවිල බීජ ගොවිපල- බී කලාපය | වාණිජ වී ලෙස සකස් කරන ලද | 07 | සම්බා | 5,197.7 | 6,000.00 |
| | | 08 | කීරි සම්බා | 25,810.7 | 26,000.00 |
| | | 09 | නාඩු | 107,034.1 | 110,000.00 |

මෙම තැන්පතු මුදල පහත පරිදි ඉදිරිපත් කල හැක.

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ මුදල් භාරකරු වෙත මුදල් ගෙවා ලබාගත් ලදුපතේ මුල් පිටපත හෝ
2. **අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය** නමින් ලියූ අවම මාස 03 ක වලංගු කාලයක් සහිත බැංකු අණකරයක් ( Bank Draft)

6. නියමිත වේලාවට නොලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. එක් ලංසුකරුවෙකුට වී කාණ්ඩ (Lots) එකකට හෝ කිහිපයකට මිල ගණන් ඉදිරිපත් කළ හැකිය. එක් වී කාණ්ඩයක් සඳහා මිල ගණන් එකක් පමණක් ඉදිරිපත් කළ හැකි අතර එක් ලංසුකරුවෙකුට එක් ලංසුවක් පමණක් ඉදිරිපත් කළ හැකිය. මිල ගණන් ඇගයීම එක් එක් කාණ්ඩ සඳහා වෙන වෙනම සිදු කරන ලබන අතර, වී තොග සඳහා ඉහළම මිලක් ලබා දෙනු ලබන හා කොන්දේසි සපුරාලන ගැනුම්කරුවන් හට මෙම වී තොග අලෙවි කරනු ලැබේ.

8. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මඟින් අනුමත කරනු ලබන ගැනුම්කරුවන්ට ඒ බව ලිඛිතව දැනුම් දෙනු ලබන අතර, එම දැන්වීමේ දින සිට දින 14 ක් තුළ සම්පූර්ණ වටිනාකම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ මුදල් භාරකරු වෙත ගෙවා ලබාගත් ලදුපත අදාල **නේවාසික ව්‍යාපාර කළමනාකාර (සී කලාපය හා බී කලාපය)** වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙම වී තොග උක්ත ලිඛිත දැනුම්දීමේ ලිපියේ දින සිට දින 30 ක් ඉක්ම යාමට පෙර අදාල ගොවිපළෙහි ගබඩා වලින් ඉවත්කර ගත යුතුය.

Reference Only

එම වී තොග ලබාගැනීමට සුදුසුකම් ලද එහෙත් නියමිත දිනට පෙර මුදල් ගෙවීමට හා නියමිත දිනට පෙර වී තොග ඉවත් කර ගැනීමට අපොහොසත් වන ගැනුම්කරුවන්ගේ ඇප තැන්පතුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් රජය සතුකර ගනු ඇත.

9. ඔබ විසින් ඉදිරිපත්කරනු ලබන මිල ගණන් අවම සති හයකට (06) වලංගු විය යුතුය.

10. මෙම ටෙන්ඩර් ක්‍රියාවලියට අදාල එක් එක් වී තොග ගබඩා වලින් ඉවත්කරගත් පසු සියළුම අයදුම්කරුවන්ගේ ඇපතැන්පතු මුදල් නිදහස් කරනු ලැබේ.

11. වී තොග ගැනුම්කරුවන් වෙත නිකුත් කිරීමේදී වී ඇසුරුම් උර සමග වී අලෙවි කරන බැවින් එක් ඇසුරුම් උරයක් සඳහා රු.100.00 බැගින් අවසන් වී තොගය ගබඩාවෙන් නිදහස් කිරීමේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ගෙවිය යුතුය.

12. තොග බැහැර කිරීමේ පිරිවැය ගැනුම්කරු විසින් දැරිය යුතුය

13. වී තොග අලෙවි කිරීම සම්බන්ධව පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙහි තීරණය අවසන් තීරණය වේ.

14. වැඩිදුර තොරතුරු සඳහා දුරකතන අංක **011 2687235, 011-2687484**.
වෙබ් අඩවිය : www.mahaweli.gov.lk

Reference Only

**<u>වාණිජ වී තොග අලෙවි කිරීම.</u>**

**<u>මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය</u>**

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ): ....................................................................................................

   ....................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය:

   ....................................................................................................

3. ආයතනයක් නම්,

   ආයතනයේ නම:....................................................................................................

   ....................................................................................................

4. ව්‍යාපාරය ලියාපදිංචි අංකය:

   ....................................................................................................

5. ලිපිනය:....................................................................................................

   ....................................................................................................

6. දුරකතන අංකය:.................................. ජංගම:.............................................................

   ෆැක්ස් අංකය:...................................... ඊ මේල් ලිපිනය: ....................................................

   මිලදී ගැනීමට අපේක්ෂිත වී තොගය:

| විස්තරය | | කාණ්ඩ අංකය (Lot No.) | වී වර්ගය | දළ වී ප්‍රමාණය (කි.ග්‍රෑ) | ඒකක මිල (කි.ග්‍රෑ. 01 ක් සඳහා) | මුලු වටිනාකම - රු. |
|---|---|---|---|---|---|---|
| **රත්කිඳ බීජ ගොවිපල - සී කලාපය** | **වාණිජ වී ලෙස සකස් කරන ලද** | 01 | සම්බා | **37,527** | | |
| | | 02 | කීරි සම්බා | **49,231** | | |
| | | 03 | නාඩු | **62,860** | | |
| | කල් ඉකුත් වූ බීජ වී වාණිජ වී ලෙස | 04 | සම්බා | **13,509.5** | | |
| | | 05 | කීරි සම්බා | **187,185.5** | | |
| | | 06 | නාඩු | **4,571.5** | | |
| අරලගංවිල බීජ ගොවිපල බී කලාපය | වාණිජ වී ලෙස සකස් කරන ලද | 07 | සම්බා | **5,197.7** | | |
| | | 08 | කීරි සම්බා | **25,810.7** | | |
| | | 09 | නාඩු | **107,034.1** | | |
| | | | | | මුලු මුදල | |

Reference Only

7. ඉදිරිපත් කරනු ලබන මුළු වටිනාකම:

අංක 01 සිට 09 දක්වා ඇති සියලුම වී තොග / එක් තොගයක් /තොග කිහිපයක් සඳහා ඉදිරිපත් කරනු ලබන මිල ගණන්

(1) මුළු වටිනාකම ඉලක්කමෙන් (රුපියල්):.......................................................................................
..............................................................................................................................

(2) මුළු වටිනාකම අකුරෙන් (රුපියල්):-...............................................................................................

..............................................................................................................................

8. ගෙවූ ඇප මුදල හා ලදුපත් අංකය /බැංකු අණකරයේ අංකය

..............................................................................................................................
(මුදල් ගෙවා ලබා ගත් ලදු පතෙහි මුල් පිටපත/බැංකු අණකරයෙහි මුල් පිටපත ඇමිණිය යුතුය.)

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ඉදිරිපත් කරන ලද උපදෙස් හා කොන්දේසි මාලාවට යටත්ව මිලදී ගැනීම සඳහා මා/අප ආයතනය විසින් මෙම ආකෘති පත්‍රය ඉදිරිපත් කරනු ලබන අතර මා/අප ආයතනය ඉදිරිපත් කරන ලද මිල ගණන් පිළිගත හොත් ඒ බැව් දැනුම් දී දින 14 ක් ඇතුළත සම්පූර්ණ වටිනාකම මුදලින් ගෙවා අදාල වී තොග දින 30 ක් ඉක්ම යාමට පෙර ගබඩා වලින් ඉවත් කරගෙන යාමට මා/අප ආයතනය එකඟ වෙමි. තවද එසේ නොකලහොත් මා/අප ආයතනය විසින් තැන්පත් කළ ඇප තැන්පතු මුදල හෝ බැංකු අණකරයේ මුදල, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් නැවත මා/අප ආයතනය වෙත නොගෙවන බව ද මා දනිමි.

| | |
|---|---|
| ......................................................... | ......................................................... |
| ආයතනයේ නම | අයදුම්කරුගේ නම හා අත්සන |
| ........................ | ........................... |
| දිනය | නිල මුද්‍රාව |

Reference Only